විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

# ප්‍රසම්පාදන දැන්වීමයි

## විදේශ රැකියා සඳහා පිටත්ව යන රැකියාලාභීන් හට හා වෙනත් විශේෂ අවස්ථා සඳහා ආහාරපාන සැපයීම හා සංග්‍රහ කටයුතු සිදුකිරීම

## PR/02/01-01(01)

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින්, විදේශ රැකියා සඳහා පිටත්වන රැකියාලාභීන් හා වෙනත් විශේෂ අවස්ථා සඳහා ආහාර පාන සැපයීම හා සංග්‍රහ කටයුතු සඳහා ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකය සහිත යථෝක්ත කාර්යය පිළිබඳව මනා පළපුරුද්දක් හා කළමනාකාරිත්වයක් ඇති ආයතන වෙතින් ජාතික තරඟකාරී ලංසු ක්‍රමය මගින්, **2026.09.14** දින **පෙ.ව 10.30** දක්වා මුද්‍රා තැබූ මිල ගණන් කැඳවනු ලැබේ.

ලංසු පත සමග ලංසුකරුගේ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකයෙහි මුල් පිටපත සහ එහි සහතික කළ පිටපතක් ඉදිරිපත් කළ යුතුය. (පරීක්ෂා කිරීමෙන් අනතුරුව මුල් පිටපත ඒ අවස්ථාවේදීම ආපසු භාරදෙනු ලැබේ).

ආපසු නොගෙවනු ලබන **රු.10,000/-** ක තැන්පතු මුදලක් කාර්යාංශයේ මුදල් අයකැමි වෙත මුදලින් ගෙවා **2026.08.20** දින සිට **2026.09.11** දින දක්වා කාර්යාල දිනයන්හි **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00** දක්වා කාලය තුළ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ, ප්‍රසම්පාදන අංශය වෙතින් ලංසු ලේඛන ලබා ගත හැකි අතර, එම ලේඛන පුරවා පිටපත් දෙකකින් යුක්තව මිල ගණන් ඉදිරිපත් කළ යුතුය. ගාස්තුවකින් තොරව අදාළ ලංසු ලියවිලි පරීක්ෂා කිරීම කාර්යාංශයේ ප්‍රසම්පාදන අංශයෙන් රාජකාරී වේලාවන් තුළ දී සිදු කළ හැක.

ලංසුපත් බහා ලූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ " **විදේශ රැකියා සඳහා පිටත්වන රැකියාලාභීන් සහ වෙනත් විශේෂ අවස්ථාවන් සඳහා ආහාර පාන සැපයීම** -PR/02/01-01 (01) " යනුවෙන් සඳහන් කළ යුතුය. නිවැරදිව සකස් කළ ලංසුපත් පහත සඳහන් ලිපිනයේ පිහිටා ඇති ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලයෙහි, දෙවන මහලේ ප්‍රසම්පාදන අංශයේ, ඒ සඳහා තබා ඇති අංක 01 දරණ ටෙන්ඩර් පෙට්ටියෙහි බහාලිය යුතුය.

ලංසුපත් භාර ගැනීම **2026.09.14** දින **පෙ.ව. 11.00** ට අවසන් වන අතර, එම කාර්යය අවසන් වූ වහාම ලංසුපත් විවෘත කරනු ලැබේ. ලංසුපත් විවෘත කරන අවස්ථාවට සහභාගී වීම සඳහා ලංසුකරුට හෝ බලයලත් නියෝජිතයකුට අවසර දෙනු ලැබේ.

මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් අවසන් තීරණය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපති සතු වේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,**
**අංක.234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**කොස්වත්ත,**
**බත්තරමුල්ල.**

**දුරකථන** : 011 2 880 500
011 2 887 585
E mail : mgr_procurement@slbfe.lk
**වෙබ් අඩවිය** : www.slbfe.lk

SLSI SYSTEM ISO 9001 CERTIFIED

"**එතෙර සවියට - මෙතෙර අත්වැල**"